# අග්‍රාමාත්‍ය කාර්යාලය

## භාවිතා කරන ලද වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

**අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත් පහත සඳහන් වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.**

| අනු. අං. | වාහන අංකය | වර්ගය | මාදිලිය | නිෂ්පාදිත වර්ෂය |
|---|---|---|---|---|
| 1 | CAB-3441 | ෆෝඩ් | Everest | 2014 |
| 2 | CAB-3452 | ෆෝඩ් | Everest | 2014 |
| 3 | KQ-5409 | ටොයෝටා | Land Cruiser V8 | 2011 |
| 4 | KR-6098 | ටොයෝටා | Land Cruiser V8 | 2011 |
| 5 | KU-2786 | ටොයෝටා | Land Cruiser V8 | 2012 |

මෙම වාහන කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවත, අංක 150, අග්‍රාමාත්‍ය කාර්යාල අරලියගහ මන්දිර පරිශ්‍රයේදී රාජකාරී දිනවල 2025-07-03 දින සිට 2025-07-17 දින දක්වා පෙරවරු 10.00 - පස්වරු 2.00 අතර කාලය තුළ පරීක්ෂා කොට බැලිය හැක.

මිල ගණන් ඉදිරිපත් කිරීමට අවශ්‍ය මූලික ආකෘති පත්‍ර එක් වාහනයක් සඳහා ආපසු නොගෙවන ගාස්තු රුපියල් 5,000.00 ක් හා ආපසු ගෙවන ඇප තැන්පතු රුපියල් 50,000.00 ක් ගෙවා 2025-07-03 දින සිට 2025-07-17 දින දක්වා, රාජකාරී දිනවල පෙරවරු 10.00 සිට පස්වරු 3.00 දක්වා කාලය තුළ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ගිණුම් ශාඛාවේදී ලබාගත හැකි අතර, මිල ගණන් එම ආකෘති පත්‍ර මගින් පමණක් ඉදිරිපත් කළ යුතුවේ.

මුද්‍රා තැබූ මිල ගණන්, අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් හෝ සභාපති, ප්‍රසම්පාදන කමිටුව, අග්‍රාමාත්‍ය කාර්යාලය, අංක 58, සර් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2025-07-18 දින පෙරවරු 10.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ **"අංක.......... දරන වාහනය සඳහා මිල ගණන් - අග්‍රාමාත්‍ය කාර්යාලය"** යනුවෙන් සඳහන් කල යුතුය.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 07, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ අංක 58, අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැක.

**දුරකථන: 011 257 5317-18, දිගුව 182-334**

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**අග්‍රාමාත්‍ය කාර්යාලය,**
**අංක 58, සර් අර්නස්ට් ද සිල්වා මාවත,**
**කොළඹ 07.**

**2025.07.03**